# නිකවැරටිය බුදුමුත්තාව රජමහා විහාරයේ පවතින වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනයක්

**වන්නිනායක ඩබ්.එම්.පි.ජේ.කේ,[1] ගමගේ එච්.ඩී.[2]**

මෙම පුරාවිද්‍යාත්මක අධ්‍යයනය ඓතිහාසික බුදුමුත්තාව රජමහා විහාරය සම්බන්ධයෙන් වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගුල්ඔිතොට කෝරළයේ බුදුමුත්තාව රජමහා විහාරය පිහිටා ඇත. බුදුමුත්තාව ටැම්පිට විහාරය සහිත භූමිය 1966 අගෝස්තු මස වැනි දින නිකුත් කරන ලද අංක 14708 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා රක්ෂිත භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ. මෙහි පුරාවිද්‍යා වටිනාකම් රැසකින් සමන්විත පුරාවස්තු දක්නට ලැබේ. මේ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව ලෙස බෞද්ධ ආරාමික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය වනවා ද? යන්න පිළිබඳව වේ. මේ අනුව උක්ත පර්යේෂණ ගැටළුව සහභාගී නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනය කොට ඇත. එම ගැටළුව අනුව යමින් මෙම විහාරයේ බෞද්ධ ආරාමික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය වනවා ද? එසේ නම් එම ලක්ෂණ මෙනවා ද? යන්න දැක්වීම මෙහි අරමුණ වේ. මෙම විහාරස්ථානයේ පවතින්නා වූ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමේ දී පෙනීගිය වැදගත් සාධකයන් ලෙස ශ්‍රී ලංකාවේ වෙනත් විහාරස්ථානයන්හි දැකිය නොහැකි ආකාරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙහි පැවතීම වැදගත් වේ. විශේෂයෙන් ම මෙහි දී වනමල්, ගිරවුන්, හංසයින් වැනි පක්ෂීන්, අටමහා නරකය, සදිව්‍යලෝක, බුද්ධ චරිතය යනාදිය වාස්තු විද්‍යා අංග නිරූපිත සිතුවම්වල දක්නට ලැබේ. ආචාර්ය එඩ්වඩ් මුලර්, එච්.සී.පී. බෙල්, ඒ.එම්. හෝකාට් හා මහාචාර්ය සෙනරත් පරණවිතාන යන පුරාවිද්‍යා කොමසාරිස්වරුන්ගේ අවධානයට ලක් වූ මෙම පුරාවිද්‍යා භූමිය තවදුරටත් විද්වතුන්ගේ පර්යේෂණයන්ට ලක්විය යුතු ව තිබේ. බුදුමුත්තාව රජමහා විහාරස්ථානයේ ද්‍රවිඩ සහ පල්ලව අක්ෂරවලින් ලියැවුණු ලේඛන තුනක් දක්නට ලැබේ. ඉන් දෙකක් පැරණි ටැම්පිට විහාර මන්දිරයේ ගල් කුලුනු දෙකක සටහන් වී ඇත. එම ලිපි දෙක මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසින් කියවා අර්ථ නිරූපණය කර තිබේ. පොළොන්නරුවේ රජකළ ජයබාහු රාජ්‍ය කාලයේ දී මෙම ස්ථානයේ ඊශ්වර දේවාලයක් තිබූ බවට ඇතැම්හු මත පළ කරන අතර වර්තමානයේ දැකිය හැක්කේ මහනුවර යුගයට අයත් ටැම්පිට විහාරයකි. අද මෙම ටැම්පිට විහාර මන්දිරයේ දක්නට ඇත්තේ වියන් සිතුවම් කිහිපයක් පමණි. මෙම ගොඩනැගිල්ලේ වහලයට යොදා ඇත්තේ පෙති උළු ය. පොලොන්නරු යුගයට අයත් ශිව කෝවිලක් ද මෙම විහාර භූමියේ දී දැකගත හැකි ය. මෙම විහාර භූමියේ දක්නට ඇති පැරණි සංඝාවාසය පුරාවිද්‍යාත්මක සහ වාස්තු විද්‍යාත්මක වටිනාකම් රැසකින් යුතු ගොඩනැගිල්ලකි. කෙසේ නමුත් මෙම විහාරය වැඩිදුරටත් අධ්‍යයනය කිරීමේ දී රජමහා විහාර ක්‍රමයෙහි පවත්නා වූ ආරාමික වාස්තුවිද්‍යා අංග රාශියක් ද පවතින බව දක්නට ලැබේ.

**ප්‍රමුඛ පද :** බුදුමුත්තාව, වාස්තුවිද්‍යා, ටැම්පිට විහාරය, සංරක්ෂණය, පුස්කොළ පොත්

---

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය. prasannajayantha2@gmail.com